# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2493/39 - 2026 ජූනි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2026.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2026 ජූනි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2026 අංක 06 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. මෙම රෙගුලාසිවල අරමුණ වන්නේ, ආනයන ගනුදෙනුවලට අදාළව ශ්‍රී ලංකාවෙන් සිදුකරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ වඩාත් ඵලදායි ලෙස අධීක්ෂණය සහ පාලනය කිරීම ශක්තිමත් කිරීම වේ.

3. 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද සහ පසුව සංශෝධනය කරන ලද, 2011 අංක 1 දරන විශේෂ ආනයන බලපත්‍ර සහ ගෙවීම් ක්‍රම රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

4. 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* 4 වන රෙගුලාසිය මෙයින් අවලංගු කරනු ලබන අතර, ඒ වෙනුවට පහත සඳහන් රෙගුලාසිය ආදේශ කරනු ලැබේ;

1A - PG 7766 — 373 (2026/06)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*"4 සියලුම බැංකු විසින් එක් එක් ගනුදෙනුව සඳහා අනන්‍ය අංකයක් ලබා දිය යුතු අතර, එලෙස ලබා දෙන ලද අංකයට අදාළ හෝ ඒ යටතේ සිදු කරනු ලබන එක් එක් ගනුදෙනුව සම්බන්ධ පහත සඳහන් තොරතුරු ඇතුළුව සියලුම තොරතුරු ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත වහාම දැනුම් දිය යුතුය –*

*අ) අදාළ ප්‍රේෂකයාගේ (ආනයනකරුගේ) වලංගු බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය;*

*ආ) ප්‍රේෂකයාගේ (ආනයනකරුගේ) ලිපිනය;*

*ඇ) ප්‍රතිලාභියාගේ ලිපිනය;*

*ඈ) ප්‍රතිලාභියාගේ ගිණුම් අංකය;*

*ඉ) බැංකු කේතය;*

*ඊ) ශාඛා කේතය;*

*උ) විදේශ මුදල් වර්ගය සහ ප්‍රමාණය;*

*ඌ) ගෙවීම් ක්‍රමය;*

*එ) භාරදීමේ කොන්දේසි;*

*ඒ) ප්‍රේෂණය සිදුකළ දිනය;*

*ඔ) නාමමාත්‍ර ඉනවොයිසි අංකය; සහ*

*ඕ) භාණ්ඩ පිළිබඳ විස්තරය"*

5. 2012 ජනවාරි 02 දිනැති අංක 1739/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ 8(3) රෙගුලාසියට වහාම පසුව 8(4) රෙගුලාසිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය පහත පරිදි කියවිය යුතුය;

*"8(4) ඉහත (1), (2) සහ (3) හි කුමක් සඳහන් වුවද, පෙර ගෙවීම් සිදු කිරීමට ප්‍රථම, ආනයනකරු විසින් පෙර ගෙවීමක් සිදු කිරීම සඳහා සුදුසුකම් ලත් ආනයනකරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීම අනිවාර්ය වේ."*

6. අදාළ ආනයනකරු, ඉහත සඳහන් කරන ලද 8(4) රෙගුලාසිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ආනයනකරුවෙකු වශයෙන් නිසි ලෙස ලියාපදිංචි වී නොමැති නම්, වාණිජ බැංකු විසින් භාණ්ඩ ආනයනය සඳහා කිසිදු පෙර ගෙවීමක් සිදු නොකළ යුතුය.

7. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, වාණිජ බැංකු වෙත හෝ වෙනත් ඕනෑම අදාළ අධිකාරීන් වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

8. මෙම රෙගුලාසි 2026 ජූනි 19 දින සිට බලාත්මක වේ.

EOG 06 - 0077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.